# පූසාගේ බඩ රිදිල්ල



නදෙව්නි ටමාෂා විජේසුන්දර

# පූසාගේ බඩ රිදිල්ල

නදෙව්නි ටමාෂා විජේසුන්දර

**ISBN - 978-624-206-763-6**

කෘතිය පළ කරන දිනය - **15.11.2023**

කතෘගේ වෙනත් කෘති - අපූරු තැග්ග

රජතුමාගේ උපාය

**Guzz** පූසාගේ අපූරු චාරිකාව

එලිනා සහ රියානා

**Liza's Dream**

# පිදුම

මෙම කෘතිය ලිවීමට මට උදව් උපකාර කළ

මගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට, ලොකුඅම්මාට,

අත්තාට, අත්තම්මාට සහ

චූටි නංගීටත්,

නිරතුරුවම මා දිරිමත් කරමින් යහමඟ පෙන්වන

ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

ඉතා සෙනෙහසින් හා ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**2023.11. 01**

# පූසාගේ බඩ රිදිල්ල

ඔන්න ගොඩාක් ඉස්සර කාලේ එක ගම්මානයක පුංචි ගෙදරක් තිබුණා. ඒ ගෙදර ගොවියෙක් ගෙවිලියක් සහ ඔවුන්ගේ දියණිය ජීවත් වුණා. මේ ගොවි දියණිය සුරතලයට ඇති කරන පූස් පැටියෙක් හිටියා. ගොවි දියණිය මේ පූසාට ගොඩක් ආදරය කළා. කෑම බීම ඇති තරම් ලබාදුන්නා. පූසා බඩ පිරෙනකම් කෑම කාලා හවස් වෙනකම් නිදා ගන්න එක තමයි කළේ. හවස් වෙලා හිතුණොත් එයාගේ යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න ගියා. හැමදේම ළඟටම හම්බ වුණ නිසා එයා ගොඩක් කම්මැලි පූසෙක් වුණා.

කම්මැලිකමට අමතරව එයාට තවත් එක නරක පුරුද්දක් තිබුණා. ඒ තමයි කෑදරකම. කොච්චර

කෑම හම්බවුණත් එයා ඒ ඔක්කොම තනියම කෑවා. යාළුවෝ කවුරුත් එක්කවත් බෙදාගෙන කන්න එයා පුරුදු වෙලා හිටියේ නෑ. යාළුවෝ කෑම ටිකක් ඉල්ලුවත් එයා මොකක් හරි බොරුවක් කියලා ඔවුන්ව මගහැරියා. ඒ නිසා යාළුවෝ පූසාත් එක්ක ටිකක් තරහින් තමයි හිටියේ. අවස්ථාවක් ලැබුණ ගමන් පූසාට පාඩමක් උගන්වන්න ඔවුන් බලාගෙන හිටියා.

මේ අතර දවසක් ගොවි ගෙදර හැමෝටම හදිසියේම ගමනක් යන්න සිද්ධ වුණා. ගොවි දියණිය පූසා ළඟට ඇවිත්,



"පූස් පැටියෝ ඔයා මේ කෑම කාලා නිදාගන්න. හවස් වෙන්න කලින් අපි ආපහු එනවා." කියලා කිව්වා.

පූසාට තනිකමක් දැනුණා. එයා ගොවි දියණිය එනකන් මග බලාගෙන හිටියා. ටික ටික දහවල් වෙලා පස්සේ හවස් වෙන්නත් ළං වුණා. ඒත් ගොවි ගෙදර අය ආපහු ආවේ නෑ. හිතපු විදියට එයාලට එදාම ආපහු ගෙදර එන්න බැරි වුණා.

පූස් පැටියා කලබල වුණා. එයා කවදාවත් ගෙදර තනියම ඉඳලා තිබුණේ නෑ. ඒ අතර එයාට ලොකු බඩගින්නක් දැනුණා. ඒත් එයාට කන්න මොනවත් තිබුණේ නෑ. කෑම බීම ඇති තරම් ළඟටම හම්බවුණ නිසා තනියම කෑම හොයාගෙන කන්න එයා පුරුදු වෙලා හිටියේ නෑ.

"හොඳටම බඩගිනියි. කන්න කිසිම දෙයක් නෑ. මම යාළුවන්ට කිසි දෙයක් දීලා නැති නිසා එයාලගෙන් ඉල්ලන්න බෑ." පූසා හිතුවා.

ඉතිං එයාට බඩගින්නෙම නින්ද ගියා. පහුවදා උදේම පූසාට ඇහැරුණා. ඒත් එයාගේ ගෙදර අය ඇවිත් හිටියේ නෑ. දැන්නම් එයාට හොඳටම බඩගිනියි. ඉවසන්න බැරිම තැන එයා යාළුවන්ගෙන්වත් කෑම ටිකක් ඉල්ලන්න හිතුවා. එයා මුලින්ම ගියේ හාවා ළඟට

"යාළුවේ මට හොඳටම බඩගිනියි. කෑම ටිකක් දෙනවාද?" පූසා ඇහුවා.

පූසාගේ කෑදරකමට පාඩමක් උගන්වන්න හිටිය හාවා එයා ළඟ තිබුන කැරට් අල ටික හංගලා

"අනේ යාළුවේ මගේ ළඟ තිබුණ කැරට් අල ඔක්කොම දැන් ටිකකට කලින් කාලා ඉවර

වුණා. කලින් ඉල්ලුවානම් දෙන්න තිබුණා."

කියලා කිව්වා.



පූසා ඊළඟට ලේන් යාළුවා ළඟට ගියා.

"යාළුවේ මට කන්න මොනවහරි දෙනවද?" පූසා ඇහුවා.

ලේනාත් එයාගේ පළතුරු ටික හංගලා "අනේ යාළුවේ ඔයාට තියා මටවත් කන්න කිසිම දෙයක් නෑ. මමත් මේ කෑම හොයාගෙන යන ගමන් ඉන්නේ." කිව්වා.

ඊළඟට පූසා වඳුරු යාළුවා ළඟට ගියා.

"යාළුවේ මට කන්න මොනවහරි දෙනවද?" පූසා ඇහුවා.

"ඔයාට කෑම තියෙන වෙලාවට ඔයා කාටවත් දෙන්නේ නැහැනේ. ඒ නිසා අපිත් ඔයාට කෑම දෙන්නේ නෑ." වඳුරා ඇත්තම කිව්වා.

මේ විදියට පූසා තවත් යාළුවෝ කීප දෙනෙකුගෙන්ම කෑම ඉල්ලගෙන ගියත් කිසිම කෙනෙක් පූසාට කෑම දෙන්න කැමති වුණේ නෑ.

පූසා දුකින් හා බඩගින්නෙන් ඇවිදගෙන ගියා. ඒ අතර මී යාළුවාට පූසාට විහිළුවක් කරන්න හිතුණා.

මීයා ඇතුලේ පණුවෝ හිටිය කුණු වුණ ඇපල් ගෙඩියක් පූසාට දුන්නා.

(ආ... දෙයක් කියන්න බැරි වුණානේ. බොහෝම ඉස්සර කාලේ හිටිය පූසන් දැන් කාලේ පූසන් වගේ නෙමෙයි, එයාලා වැඩිපුරම කන්න කැමති වුණේ එළවළු හා පළතුරු. එයිනුත් ඇපල් වලට එයාලා ගොඩක් ආසා කළා. ඒ වගේම ඒ කාලේ මීයන් හා පූසන් ගොඩක් හොඳ යාළුවෝ වෙලා හිටියා.)

ඉතිං ඇපල් ගෙඩිය දැක්ක ගමන් පූසා කටට දෙකට ඇපල් ගෙඩියම කාලා ඉවර කළා.

ඒත් ටික වෙලාවකින් කුණු වුණ ඇපල් කාලා එයාගේ බඩ හොඳටම රිදෙන්න ගත්තා. එයා වේදනාවෙන් කෑ ගැහුවා.





ඒක දැකලා මීයා හිනාවෙන්න පටන් ගත්තා. මීයා හිතාමතාම කුණු වුණ ඇපල් දුන්න බව පූසාට තේරුණා.

හොඳටම තරහා ගිය පූසා මීයාගේ ඇඟට පැන්නා. ඒත් මීයා පූසාගෙන් බේරිලා දුවගෙන ගියා. පූසාත් මීයා පස්සෙන්ම දුවගෙන ගියා. අන්තිමේදි මීයා උස ගහකට නැංගා. පූසාත් මීයා පස්සෙන් ගහට නැග්ගා. මීයා කුඩා අත්තක් දිගේ ගිහින් බිමට පැන්නා. ඒත් පූසා බර නිසා අත්ත දිගේ යන්න බැරි වුණා. එයා බිමට බහින්න බැරිව බයෙන් තරහින් හා වේදනාවෙන් කෑ ගැහුවා.



අදටත් පූසන් උස ගස් වලට නැංගත් බිමට බහින්න බය වෙන්නේ ඒ නිසයි.

ඒත් එක්කම වාසනාවකට ගොවි දියණිය එතනට ආවා. එයා ගෙදර ඇවිත් පූසා නැති නිසා පූසාව හොයන්න ඇවිත් තිබුණා.

ගොවි දියණිය දැක්ක පූසාට ගොඩක් සතුටු හිතුණා. ගොවි දියණිය පූසාව හිමින් ගහෙන් බිමට අරගෙන ගමේ වෙද මහත්තයා ළඟට අරගෙන ගියා.

වෙද මහතා කුප්පමේනියා කොළ වලින් හැදුව බෙහෙතක් පූසාට බොන්න දුන්නා. ඒක බිවුව ගමන් පූසාගේ බඩේ අමාරුව හොඳ වුණා.

අදටත් පූසන් බඩේ අමාරුව හැදුනහම කුප්පමේනියා කොළ කන්නේ ඒ නිසයි.

ඒ වගේම ඊට පස්සේ පූසන් කවදාවත් ඇපල් වගේ පළතුරු කන්න කැමති වුණේ නෑ. ඒත් එක්කම ඉස්සර කාලේ එයාලගේ යාළුවෙක් වුණ මීයා ඔවුන්ගේ ලොකුම හතුරා බවට පත් වුණා. මීයෙක් දැක්ක ගමන් පූසන් ඔවුන්ගේ පස්සෙන් පන්නන්නේ කුණු වුණ පළතුරු දුන්නට පාඩමක් උගන්වන්නයි.

ඒ වගේම අදටත් පූසන්ට ඒ බඩරිදිල්ල මතක් වෙනකොට "ආව් ආව්" කියලා කෑ ගහනවා ඔයාලට ඇහිලා තියෙනවද?

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පරියේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මන් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

**2023.11.01**